රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව
அரச கணக்குகள் திணைக்களம்
Department of State Accounts

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. SA/IC/1/3-i | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2017.12. 29 |

රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක : **260/2017**

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා
දිස්ත්‍රික් ලේකම් වරුන් වෙත

**2018 වසර තුලදී රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත**
**මාසික ගිණුම් සාරාංශ මගින් ගිණුම් දත්ත සම්ප්‍රේෂණය කිරීම**

අමුණා ඇති උපලේඛණයේ සඳහන් කර ඇති පරිදි සියළුම අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල විසින් 2018 වසර තුලදී, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත මාසික ගිණුම් සාරාංශ ඉදිරිපත් කිරීම සඳහා නියමිත දින පසුපිටෙහි දක්වා ඇත.

2. රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් කිසියම් මාසයක් සඳහා වූ මාසික ඒකාබද්ධ ගිණුම් ප්‍රකාශන ඊට පසු මාසයේ 10 වන දිනට පෙර පිළියෙල කරනු ලැබේ. එබැවින් නියමිත දිනට පෙර මෙම දෙපාර්තමේන්තුව වෙත ලැබෙන පරිදි මාසික ගිණුම් සාරාංශය **cigassummary@sad.treasury.gov.lk විද්‍යුත් තැපැල** වෙත එවීමට කටයුතු කල යුතුවේ. සාවද්‍ය තොරතුරු භාණ්ඩාගාර ගිණුම්වලට ඇතුලත් වීම වළක්වා ගනු සඳහා CIGAS වැඩසටහනට එදිනෙදා ඇතුලත් කරන තොරතුරු දිනපතා පරික්ෂාකර නිවැරදි තොරතුරු එවීමට වග බලා ගත යුතුය. මෙලෙස ඉදිරිපත් කරනු ලබන ගිණුම් සාරාංශය ප්‍රධාන මූල්‍ය නිලධාරී / ප්‍රධාන ගණකාධිකාරී / ගණකාධිකාරී විසින් **පරික්ෂා කිරීමෙන් පසුව ප්‍රධාන මූල්‍ය නිලධාරී / ප්‍රධාන ගණකාධිකාරී / ගණකාධිකාරීගේ විද්‍යුත් තැපැල් ගිණුම් (e-mail) හරහා පමණක්** එවීමට කටයුතු කල යුතු වේ. ඒ සඳහා නිලධාරියාගේ රාජකාරීමය විද්‍යුත් තැපැල භාවිතා කල යුතුවේ.

3. එමෙන්ම යම් දත්ත ප්‍රතික්ෂේප කිරීමක් වෙතොත් ඒ සම්බන්ධයෙන් විද්‍යුත් තැපැල හරහා ඔබ වෙත දැනුම් දෙනු ලබන අතර, සිදු කරනු ලබන අවශ්‍ය නිවැරදි කිරීම් නියමිත දිනට පෙර එවිය යුතුවේ.

4. ප්‍රමාද වන මාසික ගිණුම් සාරාංශ සම්බන්ධයෙන් මු.රෙ. 426 අනුව කටයුතු කරනු ලබන බව අවධාරණය කෙරේ.

**එස්.ජී. සේනාරත්න**
රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්
භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් වෙනුවට

පිටපත : විගණකාධිපති

මහා භාණ්ඩාගාරය, කොළඹ 01, ශ්‍රී ලංකාව. பொது திறைசேரி, கொழும்பு 01, இலங்கை. General Treasury, Colombo 01, Sri Lanka.
General - Tel.: +94 11 2484500/600 Ext:1149 Fax: +94 11 2484869 Website: www.sad.gov.lk
Director General - Tel.: +94 11 2484728 Fax: +94 11 2473856 e - mail: dgsa@sad.treasury.gov.lk

<u>භාණ්ඩාගාරයට මාසික ගිණුම් සාරාංශ එවිය යුතු දින දර්ශනය</u>

| ගිණුම්කරණ මාසය | විද්‍යුත් තැපැල මගින් භාණ්ඩාගාරයට ගිණුම් සාරාංශ එවිය යුතු අවසාන දිනය | | | |
|---|---|---|---|---|
| | උපලේඛණ - 1 | | උපලේඛණ - 11 | |
| ජනවාරි | පෙබරවාරි | 05 | පෙබරවාරි | 06 |
| පෙබරවාරි | මාර්තු | 06 | මාර්තු | 07 |
| මාර්තු | අප්‍රේල් | 04 | අප්‍රේල් | 05 |
| අප්‍රේල් | මැයි | 04 | මැයි | 07 |
| මැයි | ජුනි | 05 | ජුනි | 06 |
| ජුනි | ජූලි | 04 | ජූලි | 05 |
| ජූලි | අගෝස්තු | 03 | අගෝස්තු | 06 |
| අගෝස්තු | සැප්තැම්බර් | 05 | සැප්තැම්බර් | 06 |
| සැප්තැම්බර් | ඔක්තෝබර් | 03 | ඔක්තෝබර් | 04 |
| ඔක්තෝබර් | නොවැම්බර් | 05 | නොවැම්බර් | 07 |
| නොවැම්බර් | දෙසැම්බර් | 05 | දෙසැම්බර් | 06 |
| දෙසැම්බර් | මෙම දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන 2018 මුදල් වර්ෂය සඳහා ගිණුම් පියවීමේ චක්‍රලේඛයේ උපදෙස් පරිදි | | | |